අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு
Ministry of Internal and Home Affairs and Provincial Councils and Local Government
ස්වදේශ කටයුතු අංශය (ප්‍රාදේශීය පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (பிரதேச நிர்வாக) | Home Affairs division (Divisional Administration)

මගේ අංකය / எனது இல / My No: HAF-2/13/QUTRS/04/1300
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.07.

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-1/5/විවිධ හා 2019.03.27 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා නිවාස දීමනා ගෙවීම නියාමනය</u>**

ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිල නිවාස දීමනා සම්බන්ධව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක එච්ජ්/ඩීජ්/2/24 හා 1993.01.13 දිනැති ලිපියේ 3.10හි පහත පරිදි සඳහන් වේ.

"ප්‍රාදේශීය ලේකම් වශයෙන් ඔබ අනිවාර්යෙන්ම ඔබ කොට්ඨාසය තුළ පදංචිව සිටිය යුතුය. නිල නිවාස නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයාට මේ සඳහා රු.2,000.00ක නිල නිවාස දීමනාවක් මාසිකව ලබා ගත හැකිය. එසේ වෙතත් ඔබට ඔබ කාර්යාලයේ සිට සැතපුම් 10ක් තුළ පෞද්ගලික නිවසක් තිබේ නම් මෙම දීමනාව හිමිකමක් නොමැත. නිල නිවාසවල පදිංචි ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිවාස කුලිය අය කරනු නොලැබේ."

02. එය අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ලේකම්ගේ අංක HAF-1/5/විවිධ හා 2019.03.27 දිනැති ලිපියේ iii ඡේදයෙන් (ස්වදේශ කටයුතු චක්‍රලේඛ 08/2019) 2019.04.01 දින සිට පහත පරිදි සංශෝධනය වී ඇත.

"ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ තනතුරට ගැළපෙන පරිදි නිවසක් ලබා දීම සඳහා එක් එක් ප්‍රාදේශීය බල ප්‍රදේශයන්හි තක්සේරුගත නිවාස කුලියට සමාන වන නිවාස දීමනාවක් ලබා දීම, තවද නිවාස දීමනාව ලබා දීමේදී සෑම විටම රජයේ නිල නිවාසයක් සපයා දී නොමැති විට පමණක් අදාළ දීමනාව ලබා දිය යුතු අතර, නිවාස දීමනාව ලබා ගන්නා නිලධාරීන් අදාළ නිවාස තුළ පදිංචිව සිටීමද අනිවාර්ය විය යුතුය"

ාභ්‍යන්තර කටයුතු අංශය
ුள்ளக அலுவல்கள் பிரிவு
ternal Affairs Division
ටන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
ம் மாடி, "சுஹுருப்பாய", பத்தரமுல்ல, இலங்கை.
th Floor, "Suhurupaya", Battaramulla, Sri Lanka.
: +94 112 872 001/+94 112 876 586/+94 112 872 023
x : +94 112 872 024
nail : info@internalaffairs.gov.lk
eb : www.internalaffairs.gov.lk

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
TP : +94 112 676 250/+94 112 687 773
Fax : +94 112 676 252/ +94 112 699897
email : info@moha.gov.lk
web : www.moha.gov.lk

පළාත් සභා හා පළාත් පාලන අංශය
மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் பிரிவு
Provincial Councils & Local Government Division
330, යූනියන් පෙදෙස, කොළඹ, ශ්‍රී ලංකාව.
330, யூனியன் பிளேஸ், கொழும்பு 02, இலங்கை.
330, Union Place, Colombo 02, Sri Lanka.
TP : +94 112 305 326/7 or +94 112 303 280
Fax : +94 112 347 529
email : secretary@pclg.gov.lk
web : www.pclg.gov.lk

03. ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ට ගෙවනු ලබන මාසික නිල නිවාස දීමනාව ලබාදීමේ දී පහත පරිදි කටයුතු කරනු ලැබේ.

**3.1 අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නිල නිවාසයක් නොතිබේනම්,**

3.1.1 පදිංචියට තෝරාගන්නා නිවාසය, සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉතා ආසන්න විය යුතු හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටිය යුතුය.

3.1.2 සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට සැතපුම් 10ක් තුළ (16 කි.මී) පෞද්ගලික නිවාසයක් තමාට හෝ කාලත්‍රයාට හෝ නොතිබිය යුතුය.

3.1.3 තෝරාගනු ලබන නිවාසයෙහි අනිවාර්යයෙන්ම පදිංචි විය යුතුය.

3.1.4 ප්‍රාදේශීය ලේකම්වරයෙක් නම් වර්ග අඩි 2,000 හෝ ඊට අඩු නිවාසයක් ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙක් නම් වර්ග අඩි 1,500 හෝ ඊට අඩු නිවාසයක් ද තෝරා ගත යුතුය.

3.1.5 රජයේ තක්සේරු නිලධාරියෙකුගෙන් නිවාස කුළිය තහවුරු කර ඉදිරිපත් කළ යුතුය.

**3.2 අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නිල නිවාසයක් තිබේනම් හා එය පදිංචි වීමට නුසුදුසු තත්වයේ තිබේනම්,**

3.2.1 ඒ බව අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින්ම නිරීක්ෂණය කර, එය පදිංචි වීමට නුසුදුසු තත්වයේ පවතින බවත්, ඒ වෙනුවට නිල නිවාස දීමනාව ලබා දීම සුදුසු බවත් දිස්ත්‍රික් ලේකම් විසින්ම නිර්දේශ කළ යුතු වන අතර එහි වගකීම දිස්ත්‍රික් ලේකම් සතු වේ.

3.2.2 එසේ පදිංචි වීමට නොහැකි නිල නිවාස ඉතා ඉක්මනින් පිළිසකර කර දීමට දිස්ත්‍රික් ලේකම් වගබලා ගත යුතුය.

04. මෙම කරුණු ද සලකා බලා මේ සමඟ ඇති QTS 01 අයදුම්පත්‍රය සම්පූර්ණ කර දිස්ත්‍රික් ලේකම් විසින්ම කරනු ලබන නිර්දේශය සහිතව නිල නිවාස දීමනාව සඳහා ඉල්ලුම් පත්‍රය මාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව දන්වමි.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

පිටපත - සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස

# අයදුම් පත්‍රය

**<u>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-1/5/විවිධ හා 2019.03.27 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා නිවාස දීමනා ලබා ගැනීම.</u>**

1. නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................

2. තනතුර : ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්

3. සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ......................................

    3.1 දිස්ත්‍රික්කය : ......................................

4. ස්ථිර පදිංචි ලිපිනය : ..........................................................................................

..........................................................................................

    4.1 දිස්ත්‍රික්කය: .......................... 4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ................................

5. ස්ථිර පදිංචි ස්ථානයේ සිට සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇති දුර (කි.මී) : ..................

6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයක්/ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයක් තිබේ ද?

| ඔව් | | නැත | |
|---|---|---|---|

7. නිල නිවාසයක් තිබේනම් එහි පදිංචිව සිටීද/ නැද්ද? ..........................................

    7.1 පදිංචිව නොසිටීනම් හේතු : ..........................................................................................

..........................................................................................

8. විවාහක/ අවිවාහක බව : ......................................

    8.1 <u>විවාහක නම්,</u>

    8.1.1 කාලත්‍රයාගේ නම :..................................................................

    8.1.2 රැකියාව :......................................

    8.1.3 සේවා ස්ථානය :..................................................................

    8.1.4 සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය :..........................................

    8.1.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :................................

    8.1.6 කාලත්‍රයා රැකියාවක් කරයිනම් ඔහුට/ ඇයට නිල නිවසක් හිමිද? :..............

    8.1.7 එම නිල නිවසේ පදිංචිව සිටී ද? :..........................

    8.1.8 දිස්ත්‍රික්කය :......................

    8.1.9 නිල නිවස පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................

    8.1.10. තමාගේ හෝ තමාගේ කාලත්‍රයාගේ නමින් තමා සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට සැතපුම් 10 ක (16 km) සීමාව තුළ ස්ථිර නිවසක් තිබේද? :................

8.2 අවිවාහක නම්.

8.2.1 තමාගේ හෝ තමාගේ දෙමාපියන්ගේ නමින් තමා සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට සැතපුම් 10 ක (16 km) සීමාව තුළ ස්ථිර නිවසක් තිබේද? :...............................

09. ඉල්ලුම් කරනු ලබන නිවසේ වර්ග අඩි ප්‍රමාණය : ....................................

09.1 නිවාස හිමිකරුගේ නම : ......................................................................................

09.2 ලිපිනය : ......................................................................................

09.3 නිවාස හිමිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................

09.4 නිවාස හිමිකරුගේ දුරකතන අංකය : ................................

09.5 යෝජිත නිවසේ ලිපිනය :..........................................................................................

09.6 නිවස පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...........................................................................

09.7 එහි සිට සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇති දූර (කි.මී) :..................

10. මාසික තක්සේරුගත කුලිය රු: ..................................................................................................

(තක්සේරු වාර්තාව ඉදිරිපත් කළ යුතුය)

11. වෙනත් කරුණු

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

............................
දිනය

..............................
අත්සන හා නිල මුද්‍රාව
(අයදුම්කරු)

---

**ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස සේවය කරනු ලබන ඉහත නම් සඳහන් ....................................................... මහතා/ මහත්මිය/ මෙනවිය ගේ ඉල්ලීම නිර්දේශ කරමි/ නොකරමි.

............................
දිනය

.............................
අත්සන හා නිල මුද්‍රාව
(ප්‍රාදේශීය ලේකම්)

## දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය

ලේකම්,

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

01. ඉහත නම් සඳහන් නිලධාරියා/ නිලධාරිනිය සේවය කරනු ලබන ................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයක්/ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයක් ඇත/නැත.

02. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය/ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය පදිංචිය සඳහා නුසුදුසු තත්වයේ පවතින බව මා විසින් පරීක්ෂා කරන ලදී.

03. ඒ අනුව ඔහු/ ඇය වෙත රජයේ තක්සේරු ගත කුලිය අනුව නිල නිවාස දීමනාව ගෙවීම සුදුසු බව නිර්දේශ කරමි/ නොකරමි.

..............................
දිනය

..............................
අත්සන හා නිල මුද්‍රාව
(දිස්ත්‍රික් ලේකම්)

---

**අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය**

ඉහත නම් සඳහන් නිලධාරියාගේ / නිලධාරිනියගේ ඉල්ලීම අනුමත කරමි/ නොකරමි.

..............................
දිනය

..................................................
ලේකම්,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය